**ජනාධිපතිවරයාගේ අරමුදල - 2022**

**----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ජනාධිපතිවරයාගේ අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කල යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුලින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය  මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී.  මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී .

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදි.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ ආදලත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී .

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පටිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාල ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 ගෙවිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | රෝගීන් 95 දෙනෙකු වෙනුවෙන් එකතුව රු.17,252,501 ක් 2022 දෙසැම්බර් 31 දිනට අරමුදලෙන් ගෙවිය යුතුව තිබුණි. ඉන් රෝගීන් 67 දෙනෙකු වෙනුවෙන් එකතුව රු.11,377,501 ක මුදලක් වර්ෂ 01 සිට වර්ෂ 3.5 ක් දක්වා වූ කාල පරාසයක් තුළ ගෙවීම් කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | මෙම රෝගීන් 95 දෙනාගෙන් 86 දෙනෙකු සඳහා මේ වනවිට රු.මි.15.47ක ගෙවීම් සිදු කර ඇති බව දන්වා තිබුණි. | වෛද්‍යාධාර ගෙවීම් කඩිනම්ව කිරීමේ අවශ්‍යතාවය. |
| (ii) | 2022 දෙසැම්බර් 31 දිනට පෞද්ගලික රෝහල් හා පෞද්ගලික ආයතන වලින් ප්‍රතිකාර ලබා ගැනීමට සැලසීම වෙනුවෙන් අරමුදලෙන් එම ආයතන වෙත ගෙවිය යුතු වෛද්‍යාධාර අවස්ථා 31 ක් සඳහා එකතුව රු 4,011,100 ක වටිනාකමක් ගෙවිය යුතුව පැවති අතර ඉන් එකතුව රු.2,827,050 ක මුදලක් වර්ෂ 01 සිට වර්ෂ 05 ක් දක්වා කාල පරාසයක සිට ගෙවිය යුතුව පැවති බව නිරීක්ෂණය විය. | මෙම වෛද්‍යාධාර අවස්ථා 31 සඳහා අදාල රු.4,011,100.00ක මුදල මේ වනවිට ගෙවා අවසන් කර ඇති බව දන්වා තිබුණි. | ගෙවිය යුතු ශේෂ කඩිනමින් නිරවුල් කිරීමේ අවශ්‍යතාවය. |

## 1.6 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

**පහත නිරීක්ෂණ කරනු ලැබේ.**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | විගණන නිරීක්ෂණය අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149(1) ව්‍යවස්ථාව | අරමුදලේ කටයුතු අවසන් කර වසා දමන ලද දරුවන් සුරැකීම් අරමුදල හා කොවිඩ් 19 අරමුදලේ ශේෂයන් පිළිවෙලින් රු.29,254,999 ක් හා රු.218,712,624 ක් වශයෙන් එකතුව | 2022.10.10 දිනැති අම.ප./22/1608/601/018 අංක දරණ කැබිනට් තීරණය අනුව 2022.10.28 දිනට කොවිඩ් 19 - සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණ අරමුදලේ හා අ.ම.ප. /20/1009/212/017 හා | පවත්නා නීතිරීති වලට අනුකූලව කටයුතු කිරීමේ අවශ්‍යතාවය. |

| | | | |
|---|---|---|---|
| | රු.247,967,623ක් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු වුවද එම මුදල් ජනාධිපති අරමුදලට බැර කර තිබුණි. | 2020.07.16 දිනැති කැබිනට් තීරණය මගින් දරුවන් සුරකිමු ජාතික භාර අරමුදලේ මුදල් ශේෂය ජනාධිපති අරමුදල වෙත මාරු කර ඇති බවත් දන්වා තිබුණි. | |
| (ආ) 1978 අංක 07 දරණ ජනාධිපතිවරයාගේ අරමුදල් පනතේ | | | |
| (i) 03 වගන්තිය | ජනාධිපති අරමුදලේ පාලක මණ්ඩල රැස්වීමක් අවසන් වරට 2019 ඔක්තෝබර් 18 දින පවත්වා තිබුණු අතර, එදිනෙන් පසු විගණිත දිනය වූ 2023 මාර්තු 31 වන දින දක්වාත් පනතේ විධිවිධාන ප්‍රකාරව රැස්වීම් පවත්වා නොතිබුණි. | කොවිඩ් වසංගත වාතාවරණය සහ රට තුල පැවති ගැටළුකාරී වාතාවරණය නිසා රැස්වීම පැවැත්වීමට නොහැකි වී ඇති බවත් 2023.05.03 දින පාලක මණ්ඩල රැස්වීම පවත්වන ලද බවත් දන්වා තිබුණි. | පනතේ විධිවිධාන වලට අනුව කටයුතු කිරීමේ අවශ්‍යතාවය. |
| (ii) 3(2) වගන්තිය | පනතේ විධිවිධාන ප්‍රකාරව අරමුදලේ පාලක මණ්ඩලය සාමාජිකයන් හත් දෙනෙකුගෙන් සමන්විත විය යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසාන වන විට අරමුදලේ පාලක මණ්ඩලය සාමාජිකයන් 06 දෙනෙකුගෙන් පමණක් සමන්විත වී තිබුණි. | ජනාධිපතිවරයා විසින් පත්කරන ලද වෙනත් සාමාජිකයන් දෙදෙනාගෙන් එක් අයකු ඉල්ලා අස්වීම නිසා පාලක මණ්ඩලය 6 දෙනෙකුගෙන් සමන්විත වී තිබූ බව දන්වා තිබුණි. | පනතේ විධිවිධාන වලට අනුව කටයුතු කිරීමේ අවශ්‍යතාවය. |
| (iii) 06 වගන්තිය | අරමුදලට අයත් මුදල්, පාලක මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන අකාරයට ජනාධිපතිවරයාගේ විධිවිධාන වලට යටත් ව යොදවනු ලැබිය හැකිය. සමාලෝචිත වර්ෂය තුලදී දරා තිබූ එකතුව රු.2,688,482,710 ක වියදම් සඳහා විගණිත දිනය වූ 2023 මාර්තු 31 දින දක්වා මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | 2023.05.03 දින පැවති පාලක මණ්ඩල රැස්වීමේ දී අදාල වියදම් සඳහා අනුමැතිය ලබා ගෙන ඇති බව දන්වා තිබුණි. | පනතේ විධිවිධාන වලට අනුව කටයුතු කිරීමේ අවශ්‍යතාවය. |

| | | | |
|---|---|---|---|
| (iv) 07 වගන්තිය | අරමුදලට අයත් යම් මුදලක් ජනාධිපතිවරයා විසින් දෙනු ලබන යම් විධිවිධාන වලට යටත් ව, මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් ආකාරයකින් ආයෝජනය කරනු ලැබිය හැකිය. සමාලෝචිත වර්ෂය තුලදී ස්ථාවර හා කාලීන තැන්පතු සඳහා ආයෝජනය කරන ලද රු.මිලියන 8,955 ක් සඳහා 2023 මාර්තු 31 දින දක්වා පාලක මණ්ඩලයේ අනුමැතියක් ලබාගෙන නොතිබුණි. | 2023.05.03 දින පැවති පාලක මණ්ඩල රැස්වීමේ දී ස්ථාවර සහ කාලීන තැන්පතු සඳහා පාලක මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇති බව දන්වා තිබුණි. | පනතේ විධිවිධාන වලට අනුව කටයුතු කිරීමේ අවශ්‍යතාවය. |
| (ඇ) 2018 ජූලි 26 දිනැති අංක 03/2018 දරණ භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛය | අරමුදල මගින් ශ්‍රී ලංකා මහ බැංකුවේ පවත්වාගෙන යනු ලබන අංක (46051) 51202 දරණ බැංකු ගිණුම 2019 වර්ෂයේ සිට 2022 දක්වා වර්ෂ 04 කට අධික කාලයක සිට අක්‍රිය තත්ත්වයේ පවතින අතර, චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාර ගිණුම වසා දැමීමට කටයුතු කර නොතිබුණි. | 2023.05.03 දින පැවති පාලක මණ්ඩල රැස්වීමේදී අංක (46051) 51202 දරණ ගිණුම වසා දැමීම සඳහා අනුමැතිය ලබා දී ඒ සම්බන්ධයෙන් කටයුතු සිදු කරමින් පවතින බවත් දන්වා තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන වලට අනුව කටයුතු කිරීමේ අවශ්‍යතාවය. |

**1.7 මුදල් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රෝහල් බිල්පත් නිරවුල් කිරීමට පහසු වන ආකාරයට චෙන්නායි පිහිටි ශ්‍රී ලංකා නියෝජ්‍ය මහ කොමසාරිස් කාර්යාලය මගින් ගෙවීම් කිරීමට හැකි වනු පිණිස අග්‍රිම ගිණුමක් 2010 වර්ෂයේ සිට පවත්වාගෙන ගොස් තිබුණු අතර 2010 වර්ෂයේ සහ 2017 වර්ෂයේ රු.මිලියන 3 බැගින් රු.මිලියන 6 ක් අග්‍රිම අත්තිකාරම් මුදලක් නිකුත් කර තිබුණි. 2010 සිට සමාලෝචිත වර්ෂය ආරම්භය තෙක් වර්ෂ 12 ක කාලයක් තුල කිසිදු ගෙවීමක් මෙම අග්‍රිම ගිණුමෙන් සිදු වී නොතිබුණි. සමාලෝචිත වර්ෂයේදී නැවත රු.මිලියන 1 ක අතුරු අග්‍රිමයක් ජනාධිපති ලේකම්තුමාගේ අනුමැතිය | දැනට මෙම අග්‍රිම ගිණුමේ රුපියල් මිලියනයට වඩා අඩු ශේෂයක් පවතින අතර එම ශේෂය අවසන් වූ පසු ඉන්දියාවේ දී සිදුකරනු ලබන සැත්කම් සඳහා ගෙවනු ලබන මුදල් ප්‍රතිපාදන අවශ්‍ය අවස්ථාවලදී පමණක් විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා ප්‍රතිපාදන මාරු කිරීම තුලින් සිදු කිරීමට සැලසුම් කර ඇති බව දන්වා තිබුණි. | අරමුදල් ඵලදායීව උපයෝජනය කිරීමේ අවශ්‍යතාවය. |

| | | | |
|---|---|---|---|
| | මත නිකුත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුල දි පමණක් රු.400,000 ක මුදලක් මෙම අග්‍රිම ගිණුමෙන් වියදම් වශයෙන් අඩු කර තිබුණි. මෙම ප්‍රමාණය ප්‍රතිපූර්ණය කළ නොහැකි තැන්පතු ගිණුමට හර කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසානයේ චෙන්නායි අග්‍රිම ගිණුම රු.මිලියන 6.68 ක් වූ අතර එම අග්‍රිමය උපයෝජනය කර නොතිබූ බැවින් එම මුදල් ඌන උපයෝජිතව පවතින බව විගණනයේ දී නිරීක්ෂණය විය. | | |
| (ආ) | චෙන්නායි හි ශ්‍රී ලංකා නියෝජ්‍ය මහ කොමසාරිස් කාර්යාලයෙන් 2023 ජනවාරි 27 දින දන්වා තිබූ පරිදි පසුගිය වර්ෂ කිහිපය තුළදී සමුච්චිත විදේශ විනිමය හුවමාරු වෙනස වූ රු.322,051 නියෝජ්‍ය මහ කොමසාරිස් කාර්යාලයට ප්‍රතිපූර්ණය කිරීම හෝ මුදල් පොතින් කපා හැරීමට පියවර ගත යුතු බව දන්වා තිබුණි. මේ පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | වර්ෂ කිහිපයක් තිස්සේ ඇති වී තිබූ සමුච්චිත විදේශ විනිමය හුවමාරු වෙනසට අදාල ගැලපුම් 2023 වර්ෂයේ දී සිදු කිරීමට කටයුතු කරනු ලබන බවද කාරුණිකව සඳහන් කරමි. | අරමුදලේ සියළු වියදම් ගිණුම්ගත කිරීමේ අවශ්‍යතාවය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.1,728,990,690 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,708,287,272 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.20,703,418 ක වර්ධනයක් නිරීක්ෂණය විය. පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී වියදම් වැඩිවීමේ ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයකින් ආදායම වැඩිවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ ක්‍රියාකාරකම්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේදී අරමුදල විසින් අදාළ කාර්යයන් ඉටුකිරීම සඳහා එකතුව රු.මිලියන 1,364.62 ක් ද ඉකුත් වර්ෂයේදී රු. මිලියන 139.16 ක් ද වැයකර තිබුණි. ඒ අනුව, ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී අරමුදල් ආධාර රු. මිලියන 1,225.46 කින් හෙවත් සියයට 880 කින් වැඩි වී තිබුණි. ඉකුත් වර්ෂ වලදී ඉල්ලුම් කරන | 2019, 2020 හා 2021 වර්ෂ වල ලැබී තිබූ අයදුම්පත් 12000 ආසන්න ප්‍රමාණයක් එවකට ලබාගෙන තිබූ ප්‍රතිපත්තිමය තීරණයක් මත ගෙවීම් සිදු නොකර රඳවාගෙන තිබූ බවත් 2022.07.28 දිනෙන් පසු රඳවාගෙන තිබූ සියළුම අයදුම්පත් ගරු ජනාධිපතිතුමා විසින් ලබාදුන් උපදෙස් අනුව පරීක්ෂා කර ප්‍රතිලාභ | අරමුදලේ ප්‍රතිලාභ ගෙවීම් කඩිනම් කිරීමේ අවශ්‍යතාවය. |

| | | | |
|---|---|---|---|
| | ලද වෛද්‍යාධාර සඳහා සමාලෝචිත වර්ෂයේ දී ගෙවීම නිසා මුදල් යෙදවීම වැඩිවී තිබූ බව නිරීක්ෂණය විය. | ලබාදිය යුතු රෝගීන් හට ප්‍රතිලාභ ලබා දීමට කටයුතු කිරීමෙන් මුදල් යෙදවීම් වැඩි වූ බවත් දක්වා තිබුණි. | |
| (ii) | සමාලෝචිත වර්ෂයේදි අරමුදල විසින් වෛද්‍යාධාර ගෙවීම් සඳහා රු. මිලියන 1,341.99 ක් වැයකර තිබුණ අතර, ඉකුත් වර්ෂයේදී ඒ සඳහා රු. මිලියන 131.86 ක් වැය කර තිබුණි. ඒ අනුව, ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී වෛද්‍යාධාර ගෙවීම් රු.මිලියන 1,210.12 කින් හෙවත් සියයට 918 කින් වැඩි වී තිබුණි. | 2019, 2020 හා 2021 වර්ෂ වල ලැබී තිබූ අයදුම්පත් 12000 ආසන්න ප්‍රමාණයක් එවකට ලබාගෙන තිබූ ප්‍රතිපත්තිමය තීරණයක් මත ගෙවීම් සිදු නොකර රඳවාගෙන තිබූ බවත් 2022.07.28 දිනෙන් පසු රඳවාගෙන තිබූ සියළුම අයදුම්පත් ගරු ජනාධිපතිතුමා විසින් ලබාදුන් උපදෙස් අනුව පරීක්ෂා කර ප්‍රතිලාභ ලබාදිය යුතු රෝගීන් හට ප්‍රතිලාභ ලබා දීමට කටයුතු කිරීමෙන් මුදල් යෙදවීම් වැඩි වූ බවත් දක්වා තිබුණි. | අරමුදලේ ප්‍රතිලාභ ගෙවීම් කඩිනම් කිරීමේ අවශ්‍යතාවය. |
| (iii) | පාර්ලිමේන්තු මන්ත්‍රීන් දෙදෙනෙක් විදේශ රෝහලකදී සිදු කළ වෛද්‍ය ප්‍රතිකාර සඳහා සමාලෝචිත වර්ෂයේදී තනි පුද්ගලයකු සඳහා ගෙවූ වැඩිම වටිනාකම වූ රු.මිලියන 6.083 ක් හා 6.955 ක් බැගින් එකතුව රු.මිලියන 13.038 ක් අරමුදලෙන් ගෙවා තිබූ බව නිරීක්ෂණය විය. | ජනාධිපති අරමුදල් පනත අනුව ජනාධිපතිතුමාගේ අභිමතය පරිදි මෙවැනි ගෙවීම් සිදුකල හැකි බව දන්වා තිබුණි. | අරමුදලේ ප්‍රතිලාභ ගෙවීමේදී වැඩි ප්‍රතිලාභීන් සංඛ්‍යාවකට ප්‍රතිලාභ සැලසීම කෙරෙහි අවධානය යොමු විය යුතු වීම. |
| (iv) | අඩු ආදායම්ලාභී පවුල්වල අ.පො.ස. (උසස් පෙළ) විභාගයට සුදුසුකම් ලබන සිසුන් වෙනුවෙන් ලබා දෙන ශිෂ්‍යත්ව ප්‍රදානය හා විශේෂ ව්‍යාපෘති වෙනුවෙන් අයවැය ඇස්තමේන්තු අනුව පිළිවෙලින් රු.මිලියන 200 ක් හා රු.මිලියන 25 ක් ප්‍රතිපාදනය කර තිබුණ ද සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂයේ දි කිසිඳු මුදලක් වැයකර නොතිබුණි. | කොවිඩ් වසංගත තත්ත්වය සහ ගැටළුකාරී තත්ත්වයන් නිසා ශිෂ්‍යත්ව ප්‍රදානය සහ විශේෂ ව්‍යාපෘති වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී සහ ඉකුත් වර්ෂයේදී මුදල් වැය කර නොතිබිනි. නමුත් 2023 වර්ෂයේ දී ශිෂ්‍යත්ව ප්‍රදාන කටයුතු සිදු කරමින් පවතින බව දන්වා තිබුණි. | අරමුදලේ සියළුම අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතු බව. |
| (v) | පනතේ අරමුණු ඉටු කර ගත හැකි අයුරින් මුදල් සමාලෝචිත වර්ෂයේ යොදවන කාර්යයන්ට අදාළ භෞතික හා මූල්‍ය තොරතුරු ඇතුළත් වන පරිදි ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. වසර කිහිපයක සිට මෙම කරුණු පෙන්වා දුන්නද එම අවශ්‍යතාවය ඉටු කිරීමට කටයුතු කර නොතිබුණි. | කොවිඩ් වසංගත තත්ත්වය සහ ගැටළුකාරී තත්ත්වය මත සකස් කර තිබූ ක්‍රියාකාරී සැලැස්මට අනුව කාර්යයන් ඉටු කිරීමට නොහැකි වී ඇති බවත් 2023 වර්ෂය සඳහා පනතේ අරමුණු ඉටුකර ගත හැකි අයුරින් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර ඒ අනුව කටයුතු සිදු කරමින් පවතින බවත් දන්වා තිබුණි. | පනතේ අරමුණු ඉටුකිරීම සඳහා විධිමත් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමේ අවශ්‍යතාවය. |

| | | | |
|---|---|---|---|
| (vi) | කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර විගණනය සඳහා ඉදිරිපත් කර තිබූ ක්‍රියාකාරී සැලැස්මට අනුව එකතුව රු.මිලියන 23.2 ක ඇස්තමේන්තුගත වියදම් සහිත ක්‍රියාකාරකම් 7ක් සිදු කිරීමට අපේක්ෂා කර තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම කිසිදු කාර්යයක් ඉටු වී නොතිබුණි. | කොවිඩ් වසංගත තත්ත්වය සහ ගැටළුකාරී තත්ත්වය මත සකස් කර තිබූ ක්‍රියාකාරී සැලැස්මට අනුව කාර්යයන් ඉටු කිරීමට නොහැකි වී ඇති බවත් 2023 වර්ෂය සඳහා පනතේ අරමුණු ඉටුකර ගත හැකි අයුරින් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර ඒ අනුව කටයුතු සිදු කරමින් පවතින බවත් දන්වා තිබුණි. | සැලසුම් අනුව කටයුතු කිරීමේ අවශ්‍යතාවය. |

## 3.2 මෙහෙයුම් ක්‍රියාකාරකම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී හෘද සැත්කම්, පිළිකා රෝග, මොළය ආශ්‍රිත රෝග, දණහිස් හා උකුළ ආශ්‍රිත රෝග, වකුගඩු රෝග සහ වෙනත් ප්‍රතිකාර සඳහා රෝගීන් 5,101 දෙනෙකු වෛද්‍යාධාර ඉල්ලීම් කර තිබුණු නමුත්, රෝගීන් 2,750 දෙනෙකු සඳහා පමණක් වෛද්‍යාධාර ගෙවීම් කර තිබුණි. ඉකුත් වර්ෂයේදී මෙවැනි රෝග සඳහා වෛද්‍යාධාර වශයෙන් රෝගීන් 1,322 දෙනෙකු සඳහා ගෙවීම් කර තිබුණි. ඒ අනුව, ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී වෛද්‍යාධාර ගෙවූ රෝගීන් සංඛ්‍යාව 1,428 කින් හෙවත් සියයට 107 කින් වැඩි වී තිබුණ ද සමාලෝචිත වර්ෂයේදී අයදුම් පත් ඉදිරිපත් කළ සංඛ්‍යාව හා ප්‍රතිලාභ ලැබූ සංඛ්‍යාව සමග සැසඳීමේ දී එය සියයට 54 ක් පමණක් විය. | පිළිතුර ඉදිරිපත්කර නැත. | අරමුදලේ අරමුණු උපරිමයෙන් ඉටුකර ගැනීමේ අවශ්‍යතාවය. |